# වාණිජ ධාරා

**වාණිජ විෂයය ගුරු සිසු අත්වැල**
**(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)**

**Business Studies**

නිපුණතාව 5

සමාජ, ආර්ථික හා පුද්ගල සංවර්ධනය සඳහා ව්‍යවසායකත්වයෙහි දායකත්වය අගයයි.

---

# ව්‍යවසායකත්වය
# Entrepreneurship


**අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා**
**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ**

**සම්පත් දායකත්වය : P N L ගුණතිලක මිය**
**BSc. Business Administration (Special) USJP**

**ර / ශ්‍රී බුද්ධ ජයන්ති ම. ම. වි.**


**වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය**

**නිපුණතා මට්ටම 5.1 :** ව්‍යවසායකත්වයේ වැදගත්කම හා ප්‍රතිලාභ අධ්‍යයනයෙන් ව්‍යවසායකයකු වීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි.

**ඉගෙනුම් ඵල :**

- පිළිගත් නිර්වචන අධ්‍යයනයෙන් ව්‍යවසායකත්වය සඳහා අර්ථකථනයක් ගොඩ නගයි.
- ව්‍යවසායකත්වයේ වැදගත්කම අගයයි.
- ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර සම්බන්ධතාව පැහැදිලි කරයි.
- ව්‍යවසායකත්වයෙන් ලැබෙන පුද්ගල, ආයතනික, සමාජ හා ආර්ථික ප්‍රතිලාභ ලැයිස්තුගත කරයි.
- තෝරාගත් ව්‍යසායක් සැලකිල්ලට ගෙන, ඉන් ව්‍යවසායකයාට, ආයතනයට, සමාජයට හා ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභ වෙන් වෙන්ව ගොනු කරයි.
- ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරයි.

# ව්‍යවසායකත්වය
# *Entrepreneurship*

## ව්‍යවසායකත්වය අර්ථ දැක්වීම

"මිනිස් අවශ්‍යතා හා වුවමනා හඳුනාගෙන, ඒවා තෘප්තිමත් කිරීම සඳහා ව්‍යාපාර අවස්ථා මතු කරමින්, අවදානම් කළමනාකරණය කරමින් කෙරෙන නව්‍යතා සම්පාදන ක්‍රියාවලිය."

නැතහොත්,

"පරිසර අවස්ථා නිර්මාණශීලිව උකහා ගනිමින්, අවදානමක් දරා, නවෝත්පාදන බිහි කිරීමේ ක්‍රියාවලිය."

**'ව්‍යවසායකත්වය'** ලෙස හැඳින්වේ.

## ව්‍යවසායකත්වය පිළිබඳ විවිධ නිර්වචන

- "අවස්ථාවක් උදාකර ගෙන ඉන් ප්‍රයෝජන ගැනීමට සංවිධානයක් නිර්මාණය කරන්නා ව්‍යවසායකයෙකි. අවස්ථා උදාකර ගෙන ඒවා ප්‍රයෝජනයට ගැනීම සඳහා සංවිධාන නිර්මාණය කිරීමේ දී සම්බන්ධ වන සියලු කටයුතු සහ කාර්ය ව්‍යවසායකත්ව ක්‍රියාවලියට ඇතුළත් වේ."
  - විලියම් ඩී. බයිග්‍රේව් -

- "නව භාණ්ඩ හා සේවා හදුන්වා දීමෙන් හෝ නව සංවිධාන ක්‍රම නිර්මාණය කිරීමෙන් හෝ නව අමුද්‍රව්‍ය භාවිත කිරීමෙන් හෝ පවත්නා අර්ථ ක්‍රමය වෙනස් කිරීමේ ක්‍රියාවලිය ව්‍යවසායකත්වයයි."
  - ජෝෂප් ෂුම් පීටර් -

- "ප්‍රාග්ධනය හා ශ්‍රමය අතර අතරමැදියෙකු ලෙස කටයුතු කිරීම ව්‍යවසායකත්වයයි."
  - ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය -

- "අවිනිශ්චිතතාවලට මුහුණ දීම ව්‍යවසායකත්වයයි."
  - රිචඩ් නැන්ටිනට් -

- "නව ව්‍යාපාරයක් දියත් කොට සාර්ථක ව පවත්වාගෙන යාමට ඇති හැකියාව ව්‍යවසායකත්වයයි."
  - අන්තර්ජාතික කම්කරු සංවිධානය -

**ක්‍රියාකාරකම**

"ගයාන් තම පියා විසින් පවත්වා ගෙන ගිය සිල්ලර වෙළෙඳසැල සුපිරි වෙළෙඳසැලක් බවට පරිවර්තනය කර පවත්වා ගෙන යයි."

"සුජීව ඩෙංගු රෝගය මර්ධනය සඳහා තමන්ගේ ම වට්ටෝරුවක් අනුව ශාඛසාර ඖෂධයක් නිපදවා වෙළෙඳපොළට ඉදිරිපත් කර ඇත."

"නාලක අලාභ ලබමින් ධාවනය කළ බස් රථයක් බද්දට ගෙන නව අංග එක්කර එම මාර්ගයේම ධාවනය කරයි.

- ඉහත ප්‍රකාශවල සඳහන් පුද්ගලයින් තුළ ඇති විශේෂ ලක්ෂණ මොනවාද?

**අභ්‍යාස**

01."ව්‍යවසායකත්වය'' යන්නෙහි වඩාත් ම නිවැරදි අර්ථය වන්නේ,

i. ව්‍යාපාරික අවස්ථා හඳුනාගෙන ඒවායින් ප්‍රයෝජන ගැනීම ය.
ii. බාධක මැඩ ගෙන ඉදිරියට යාමේ හැකියාව ය.
iii. නවතම තාක්ෂණය උපයෝගී කරගෙන නව භාණ්ඩ හා සේවා නිපදවීම ය.
iv. නව්‍යතා මගින් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීමට ව්‍යාපාර අවස්ථා සොයා යාම හා භාර ගැනීම ය.
v. ගැටලු නිරාකරණය හා නිවැරදි තීරණ ගැනීමේ හැකියාව ය.

(A/L 1999)

02.නවෝත්පාදනය (Innovation) ලෙස සලකන්නේ,

i. නව නිෂ්පාදන නිර්මාණය කිරීම ය. (New Product)

ii. නව නිෂ්පාදන ක්‍රම නිර්මාණය කිරීම ය. (New Production method)

iii. නව වෙළෙඳ පොළවල් නිර්මානය කිරීම ය. (New market)

iv. නව සංවිධාන ක්‍රම නිර්මාණය කිරීම ය. (New Form of organization)

v. ඉහත සියල්ලම ය.

03."ව්‍යවසායකත්වය" යන්න පැහැදිලි කරන්න. (A/L 2002)

**ව්‍යවසායකත්වය වැදගත් වන්නේ ඇයි?**

- ලෝකය වේගයෙන් වෙනස් වේ. එම වෙනස්කම් වලට සාර්ථකව මුහුණ දිය හැක්කේ ඊට ප්‍රතික්‍රියා දැක්විය හැකි නව්‍යතා සෙවිය හැකි ව්‍යවසායකයින්ට පමණි. එම නිසා ව්‍යවසායකයින්ගේ දැඩි අවශ්‍යතාවයක් පවතී.
- තරගකාරිත්වයට සාර්ථකව මුහුණ දෙමින් ව්‍යාපාර ලෝකයේ රැඳී සිටීම සඳහා නවෝත්පාදන බිහි කිරීමේ අවශ්‍යතාව පැවතීම.
- වෙනස් වන ලෝකයට නායකත්වය දිය හැක්කේ ව්‍යවසායකයින්ට බැවින් සෑම සංවිධානයකටම ව්‍යවසායකයින් අවශ්‍ය වීම.
- පුද්ගල අවශ්‍යතා හා වුවමනා උසස් මට්ටමින් තෘප්තිමත් කිරීමෙන් ජීවන තත්වය උසස් කිරීම සඳහා නවෝත්පාදන බිහි කිරීමේ අවශ්‍යතාව පැවතීම.
- දිනෙන් දින වෙනස් වන නව තාක්ෂණය හමුවේ ව්‍යාපාර කටයුතු දියුණු කර ගැනීමේ අවශ්‍යතාව පැවතීම.
- ව්‍යවසායකයින් නව නිපැයුම් කරමින්, නව ව්‍යාපාර ඇරඹීමෙන් නව රැකියා නිර්මාණය කළ හැකි වීම.




**ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර ඇති සම්බන්ධතාවය**

| ව්‍යවසායකත්වය | ව්‍යාපාර |
| --- | --- |
| **මිනිස් අවශ්‍යතා හා වුවමනා හඳුනා ගෙන ඒවා තෘප්තිමත් කිරීම සඳහා ව්‍යාපාර අවස්ථා මතුකරමින් අවදානම් කළමනාකරණය හා නව්‍යතා සම්පාදනය කිරීමේ ක්‍රියාවලියයි.** | **මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම හා ඊට අනුබද්ධ කටයුතුය.** |

- මේ අනුව ව්‍යවසායකත්වය තුළින් ද, ව්‍යාපාර විසින් ද මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා භාණ්ඩ හා සේවා නිපදවීම හා ඒ ආශ්‍රිත සේවාවල නිරත වේ. නමුත් ව්‍යාපාරවලට සාපේක්ෂව ව්‍යවසායකත්වය විසින් ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම, අවදානම් කළමනාකරණය හා නව්‍යතා සම්පාදනය යන කටයුතුවල ද නිරත වේ.
- මේ අනුව සියලු ව්‍යවසාය ව්‍යාපාර වන අතර සියලු ව්‍යාපාර ව්‍යවසායන් නො වන බව ද පැහැදිලි වේ.
- එසේ ම ව්‍යවසායකත්වයේ අවසාන ප්‍රතිඵලය ව්‍යාපාර ලෙස හැඳින්විය හැකි ය.

**අභ්‍යාස**

01. පහත සඳහන් පුද්ගලයන් අතුරෙන් ව්‍යවසායකයකු ලෙස සැලකීමට වඩාත් ම සුදුසු පුද්ගලයා කවුද?

   i. රුවන් පිටරටින් වාහන කොටස් ගෙන්වා දේශීයව එකලස් කරයි.
   ii. කමල් විදේශීය බහුජාතික සමාගමක දේශීය නියෝජිතයා ලෙස කටයුතු කරයි.
   iii. සුනිල් ලියාපදිංචි මූල්‍ය සමාගමක කොටස් අයිතිකරුවෙකි.
   iv. නිමල් නව නිෂ්පාදනයකට අදාළ පේටන්ට් බලපත්‍රයක් මිල දී ගෙන එම නිෂ්පාදනය වෙළඳ පොළට හඳුන්වා දී ඇත.
   v. රංජිත් තම පියාගෙන් ලද ඖෂධ වට්ටෝරුවක් වැඩි දියුණු කර හිස කැක්කුමට නව ආලේපයක් නිෂ්පාදනය කර ඇත. (A/L 2016)

02.

   i. නිමල් සිය පියාගෙන් උරුම වූ කර්මාන්ත ශාලාව නව යන්ත්‍රසූත්‍ර යොදා පුළුල් කර පවත්වා ගෙන යයි.
   ii. සමන් විදේශ රැකියාවකින් උපයාගත් මුදල් යොදා සංචාරක හෝටලයක් අරඹා පවත්වාගෙන යයි.
   iii. කමල් තම සාම්ප්‍රදායික සිල්ලර වෙළෙඳ සැල සුපිරි වෙළෙඳ සැලක් බවට පරිවර්තනය කර පවත්වාගෙන යයි.
   iv. පියල් ඔහුගේ ම වට්ටෝරුවක් අනුව පරිසර හිතකාමී මදුරුනාශකයක් නිපදවා වෙළඳ පොළට බෙදා හරියි.
   v. අජිත් විදේශ රටක නිපදවූ සූර්යශක්තියෙන් ක්‍රියාකරන විදුලි බල්බයක පේටන්ට් අයිතිය මිලට ගෙන එය නිපදවා දේශීය වෙළඳ පොළට අලෙවි කරයි.

ඉහත සඳහන් අය අතුරෙන් ව්‍යවසායකයකු ලෙස සැලකිය හැක්කේ,

a. නිමල් ය. b. පියල් ය. c. සමන් ය.
d. අජිත් ය. e. කමල් ය. (A/L 2010)

03.ව්‍යවසායකයා,


i. සුළු පරිමාණ ව්‍යාපාරිකයෙකි.
ii. මහා පරිමාණ ව්‍යාපාරිකයෙකි.
iii. සේවා ස්පයන ව්‍යාපාරිකයෙකි.
iv. කාර්මික ව්‍යාපාරිකයෙකි
v. ඉහත ඕනෑ ම කෙනෙකි.

04.පහත දැක්වෙන ව්‍යාපාරිකයන් අතුරෙන් ව්‍යවසායකයෙක් ලෙස සැලකිය හැක්කේ,


i. කුඩා පරිමාණයේ සිල්ලර වෙළෙඳ සැලක් ආරම්භ කරන්නෙක්
ii. සීමාසහිත සමාගමක කොටස් මිලට ගැනීම හා විකිණීමේ යෙදී සිටින්නෙක්
iii. සමපේක්ෂණ කටයුතු සඳහා ආයෝජන කරන්නෙක්
iv. නව නිෂ්පාදනයක් වෙළඳ පොළට හඳුන්වා දෙන්නෙක්
v. ඉහත සියල්ලන් මය.

## ව්‍යවසායකත්වයේ ප්‍රතිලාභ


### 1. පුද්ගල ප්‍රතිලාභ



## 2. ආයතනික ප්‍රතිලාභ




## 3. සමාජයීය හා ආර්ථික ප්‍රතිලාභ




**ක්‍රියාඃ**

ඔබ ප්‍රදේශයේ සිටින ව්‍යවසායකයකු සැලකිල්ලට ගෙන ඔහුගෙන්

- ව්‍යවසායකයාට
- සමාජයට
- ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභ ලියා දක්වන්න.

**අභ්‍යාස**


01. සිරිමලී විසින් තම ප්‍රදේශයෙන් බහුලව ලබාගත හැකි කෙසෙල් කෙඳි භාවිත කර කාන්තා අත් බෑග්, හිස්වැසුම් හා වෙනත් විසිතුරු නිර්මාණ නිපදවීමේ ආයතනයක් රු. 50 000ක මුදලක් ආයෝජනය කර ආරම්භ කරන ලදී. ඇය විසින් තම ප්‍රදේශයේ රැකියා විරහිත තරුණියන් තිදෙනකුට එම නිෂ්පාදන පිළිබඳ පුහුණුවක් ලබාදීමෙන් අනතුරුව දෛනිකව රු. 800 බැගින් ගෙවීමේ පදනම මත සේවයට බඳවා ගන්නා ලදී. එසේ ම තම නිෂ්පාදන සංචාරක හෝටල් තුළ අලෙවි කිරීමට ද කටයුතු සිදු කරන ලදී. මෙම සිද්ධිය තුළ ඇති සමාජීය හා ආර්ථික ප්‍රතිලාභ මොනවා දැයි දක්වන්න. (ලකුණු 04 යි)

(A/L 2019 New)

## ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය

ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය අතර ඇති සම්බන්ධතාව පහත දැක්වෙන කරුණු මගින් පැහැදිලි කළ හැකි ය.

- නව රැකියා සම්පාදනයෙන් ආර්ථික සංවර්ධනය වේගවත් වීම.




- නව රැකියා අවස්ථා බිහි වීමෙන් සේවා නියුක්ති මට්ටම ඉහළ යාම.
- ව්‍යවසායකත්වය නිසා නව්‍යතා බිහි වීමෙන් ජාතික නිෂ්පාදිතය ඉහළ යාම.
- වෙළෙඳපොළ කටයුතු පුළුල්වීමත්, නව තරගකාරී වෙළෙඳපොළවල් බිහිවීමත් මඟින් ආර්ථික සංවර්ධනය ඉහළ යාම.
- ප්‍රාදේශීය සම්පත් භාවිතයට ගැනීමෙන් ඒවාට ඉහළ ඉල්ලුමක් ඇති වීම.
- නව ව්‍යාපාර බිහි වීම නිසා ආර්ථික සංවර්ධනය ඇති වීම.

**අභ්‍යාස**

01.ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයකුට අත් වන පුද්ගල ප්‍රතිලාභයක් වන්නේ,

i. දළ දේශීය ආදායම වැඩි වීමයි.
ii. සේවා නියුක්තිය වැඩි වීමයි.
iii. සමාජ තත්වය හා පිළිගැනීම වැඩි වීමයි.
iv. නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවස්ථා වැඩි වීමයි.
v. ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යාමයි.

02."රටක ආර්ථික සංවර්ධනයට ව්‍යවසායකත්වය දායක වෙයි." මෙම අදහස උදාහරණ සපයමින් පැහැදිලි කරන්න.

(A/L 2016)

## ව්‍යවසායකත්වයේ ප්‍රවණතා

- **ගෝලීය ව්‍යවසායකත්වය**

  සන්නිවේදන තාක්ෂණයේ හා ප්‍රවාහනයේ දියුණුව පදනම් කර ගෙන දේශ සීමා මායිම්වලින් බැහැරව, ලොව සියලුම රටවල පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා හා වුවමනා හඳුනාගෙන ඒවා සපුරාලීමට තම නිෂ්පාදිත ලබා දීම මගින් ගෝලීය වශයෙන් වෙළෙඳාමේ යෙදීම, එය ගෝලීය ව්‍යවසායකත්වය ලෙස හැඳින්වේ. අන් රටවල් සමඟ සබඳතා පවත්වා ගනිමින්, ජාතීන් අතර පවතින සංස්කෘතීන්ගේ වෙනස්කම් හඳුනාගැනීම මගින් ව්‍යාපාර අවස්ථා සම්පාදනය කර ගත හැකි වේ.

- **සමාජීය ව්‍යවසායකත්වය**

  සමාජීය මෙහෙවරක් කිරීමේ චේතනාවෙන් සමාජීය ගැටලුවලට පිළියම් යෙදීමට නවෝත්පාදනයේ යෙදීම මින් අදහස් කෙරේ. මානසික තෘප්තිය, පිළිගැනීම, ප්‍රසංසාව, පරෝපකාරය යනා දී ප්‍රතිලාභ සමාජීය ව්‍යවසායකත්වය තුළින් අපේක්ෂා කෙරේ. සමාජීය ව්‍යවසායකයින්ගේ අරමුණ වන්නේ ලෝකය යහපත් ස්ථානයක් බවට පත් කිරීමයි.

- **හරිත ව්‍යවසායකත්වය**

  හරිත ව්‍යවසායකත්වය යනු පාරිසරික හා සමාජීය ගැටලු හෝ අවශ්‍යතා සඳහා ඉතා ඉහළ අවදානමකින් යුතු ව ස්වභාවික පරිසරයට ධනාත්මක බලපෑම් ඇති කිරිමට ව්‍යවසායකත්ව අදහස් මගින් දැනුවත් භාවයකින් යුතු ව කරනු ලබන ක්‍රියාකාරකම් ය. හරිත ව්‍යවසායකයින් පරිසරය සුරැකීම ඔවුන් ගේ හර සංකල්පය ලෙස සලකයි. පරිසර ගැටලුවලට ඉතා සංවේදී අය වේ. මෙම ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර කටයුතුවලින් ස්වභාවික පරිසරයට ධනාත්මක බලපෑම් ඇති කරයි.



- **අභ්‍යන්තර ව්‍යවසායකත්වය**

  සංවිධානවල විවිධ තනතුරුවල කටයුතු කරන නිර්මාණශීලී පුද්ගලයින් එම ආයතනවල නිෂ්පාදිත හා නිෂ්පාදන ක්‍රමවල වෙනස්කම් සිදු කරයි. ඉහළ කළමනාකරුවන් එම නිර්මාණශීලි කටයුතු කිරිම සඳහා එවැනි පුද්ගලයන් දිරිගන්වයි. මෙසේ සංවිධානයක වෙනස්කම් හඳුන්වා දෙන, ආයතනයක් තුළ ක්‍රියාත්මක වන ව්‍යවසායකත්වය අභ්‍යන්තර ව්‍යවසායකත්වය ලෙස හැඳින්වේ.

**අභ්‍යාස**

01. පහත දෑ අතුරෙන් අභ්‍යන්තර ව්‍යවසායකත්ව ලක්ෂණය කුමක් ද?
   i. සංවිධානවල තනතුරු සඳහා වඩාත් නිර්මාණශීලී පුද්ගලයන් බඳවා ගැනීම
   ii. සංවිධානවල කටයුතු කරන නිර්මාණශීලී පුද්ගලයන් විසින් නිෂ්පාදනයේ නවෝත්පාදන ක්‍රම හඳුන්වාදීම
   iii. සංවිධාන විසින් පුද්ගල අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා නිෂ්පාදිත සැපයීම
   iv. පාරිසරික හා සමාජීය ගැටලු පිළිබඳ සලකා බලමින් පරිසරයට ධනාත්මක බලපෑම් ඇති කිරීම
   v. මානව හිතවාදී ලෝකයක් නිර්මාණය කිරිමට උත්සාහ දැරීම

(A/L 2019 New)

02. "සමාජයීය ව්‍යවසායකත්වය'' වඩාත් හොඳින් විස්තර කෙරෙන්නේ,
   i. අවතැන් වූ පුද්ගලයින් සඳහා කුඩාරම් සැපයීම යන්නෙනි.
   ii. පාසල් ළමයින් සඳහා නොමිලයේ පෙත්පත් බෙදා දීම යන්නෙනි.
   iii. තම ව්‍යාපාරයට පවුලේ සාමාජිකයින් හවුල් කර ගැනීම යන්නෙනි.
   iv. ඉන්ධන භාවිතය අවම කිරීම සඳහා නවතම උපකරණයක් නිෂ්පාදනය කිරීම යන්නෙනි.
   v. ආබාධිත තරුණ තරුණියන්ට ආයතනය තුළ 10%ක රැකියා ප්‍රතිශතයක් ලබා දීම යන්නෙනි.

(A/L 2016)

03. ව්‍යාපාර ආයතනයක සේවකයින්ගේ නිර්මාණශීලිත්වය තුළින් ඇතිවන ව්‍යවසායකත්වය හැඳින්වීමට යොදන නාමය කුමක්ද?

(A/L 2013 New)

04. පවතින ව්‍යාපාර සංවිධානයක සේවකයින් විසින් නව නිෂ්පාදිත හෝ අදහස් ඉදිරිපත් කිරීමේ හා සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය හැඳින්වෙන්නේ කිනම් නමකින්ද?

(A/L 2008)

**නිපුණතා මට්ටම 5.2 :** ව්‍යවසායකත්ව ක්‍රියාවලිය අධ්‍යයනය කරයි.

**ඉගෙනුම් ඵල :**

- ව්‍යවසායකත්වය ක්‍රියාවලියක් බව තහවුරු කරයි.
- ව්‍යවසායකත්ව ක්‍රියාවලිය හඳුන්වයි.
- ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර පෙළගස්වයි.
- ව්‍යවසායකත්ව ක්‍රියාවලිය රූප සටහනකින් දක්වයි.
- ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ එක් එක් පියවර විස්තර කරයි.

## ව්‍යවසායකත්ව ක්‍රියාවලිය


**කණ්ඩායම් ක්‍රියාකාරකම**

- ඔබේ කණ්ඩායම නව නිෂ්පාදිතයක් නිපදවීමට අදහස් කරන්නේ යැයි සිතන්න.
- ඔබගේ කණ්ඩායම නිපදවීමට අදහස් කළ නිෂ්පාදිතය හඳුන්වන්න.
- එම නිෂ්පාදිතය පිළිබඳ අදහස මතුකර ගත් ආකාරය පැහැදිලි කරන්න
- ඔබට එම නිෂ්පාදිතය නිපදවීමට අවශ්‍ය සම්පත් ලැයිස්තුවක් ලියන්න.
- එම සම්පත් සපයා ගන්නා ආකාරය සාකච්ඡා කරන්න.
- ඔබ එම අදහස යථාර්ථයක් බවට පත්කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.
- ඉහත ව්‍යපාර අදහස ක්‍රියාවට නැංවීමෙන් ඔබ අපේක්ෂා කරන ප්‍රතිලාභ මොනවා ද ?
- ඔබ කණ්ඩායමේ නිර්මාණය පන්තියට ඉදිරිපත් කරන්න.

**ව්‍යවසායකත්ව ක්‍රියාවලිය**

**ව්‍යාපාරික අවස්ථා හඳුනා ගැනීමත්, ඒවා ප්‍රයෝජනයට ගැනීම සඳහා සංවිධාන නිර්මාණය කිරීමත් යනාදී කටයුතු වලදී සිදු කිරීමට යෙදෙන සියලුම ක්‍රියාවන් ව්‍යවසායකත්ව ක්‍රියාවලිය ලෙස හැඳින්වේ.**

**ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර**




**1 පියවර – නව්‍යතා සම්පාදනය**

ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ ප්‍රථම අදියරේ දී ව්‍යවසායකයා විසින් අදහස් ජනනය කර ගැනීමත්, පරිසර අධ්‍යයනය තුළින් අවස්ථා හඳුනා ගැනීමත්, වෙළෙඳපොළ අධ්‍යයනය කිරීමත් සිදු කරයි.

**2 පියවර – සංකල්ප ගොඩනැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම**

මෙම අදියරේ දී ව්‍යාපාර සැලැස්මක් සකස් කෙරේ. එමගින් ව්‍යාපාර අදහස පැහැදිලි කෙරෙන විස්තරාත්මක වැඩපිළිවෙලක් ඉදිරිපත් කෙරේ.

**3 පියවර – අවශ්‍ය සම්පත් සම්පාදනය**

මෙම අදියරේ දී ව්‍යවසායකයා විසින් ව්‍යාපාරය ආරම්භ කිරිම සඳහා අවශ්‍ය මූල්‍ය, මානව සහ භෞතික සම්පත් හඳුනා ගන්නා අතර, ඒවා අත්කර ගැනීමට කටයුතු කරයි.

**4 පියවර – යථාර්ථයක් බවට පත් කිරිම**

මෙම අදියරේ දී ව්‍යවසායකයා ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු සිදු කරන අතර, ව්‍යාපාර අරමුණු ඉටු කර ගැනීම සඳහා සම්පත් උපයෝගී කරගනී.

**5 පියවර – ප්‍රතිලාභ ලැබීම**

ව්‍යාපාරයේ අනාගත වර්ධනය හා සංවර්ධනය පිළිබඳ තීරණ ගැනීම ව්‍යවසායකයා සිදු කරන්නේ මෙම අදියරේ දී ය.

**කණ්ඩායම් ක්‍රියාකාරකම**

"පුංචි කාලේ අපේ අම්මා හැමදා ම අපට පලා වර්ගයක් කන්න දෙනවා. ඒත් දැන් ඉන්න අම්මලාගේ කාර්ය බහුලත්වය නිසා දරුවන්ට දෙන්න පලා වර්ග වවන්න, හදන්න, කපන්න වේලාවක් නැහැ. මම මේකට විසඳුමක් සැහෙන කාලයක් තිස්සේ කල්පනා කළා. තොරතුරු එකතු කළා. පරියේෂණ කළා. ඒ කැපවීමේ ප්‍රතිඵලයක් වශයෙන් සකස් කල පලා පැකට් වෙළෙඳපොළට ගෙන එන්න මම සැලසුම් කළා. කාබනික පොහොර යොදා මගේම ඉඩමක වගා කළ පලා වර්ග ගෙන ඒවා කපලා සකස් කරලා සෞඛ්‍යාරක්ෂිත ව පැකට් කරලා වෙළෙඳපොළට ඉදිරිපත් කළා. මට ගොඩක් බාධක ආවා. නමුත් මම සැලුනේ නැහැ. අද මම ඉතා සාර්ථක ව මගේ ව්‍යාපාරය කරනවා."

- ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර ඉහත සිද්ධිය ඇසුරෙන් පැහැදිලි කරන්න.

**නිපුණතා මට්ටම 5.2 :** ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා සංවර්ධනය කර ගනිමින් ව්‍යවසායකයෙකු ලෙස කටයුතු කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**ඉගෙනුම් ඵල :**

- ව්‍යවසායකයා යන්න හඳුන්වයි.
- ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර වෙනස පැහැදිලි කරයි.
- ව්‍යසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා ලැයිස්තු ගත කරයි.
- ව්‍යවසායකයින්ගේ චරිත කතා අධ්‍යයනයෙන් ඔවුන් තුළ දක්නට ඇති ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා මතු කර දක්වයි.
- සාර්ථක ව්‍යවසායකයකු වීම සඳහා ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතාවල වැදගත්කම පැහැදිලි කරයි.
- දෙන ලද තත්ත්වයක් තුළ ව්‍යවසායකත්ව ගති ලක්ෂණ ප්‍රදර්ශනය කරයි.
- ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා සංවර්ධනය කරගත හැකි මාර්ග විමසයි.

## ව්‍යවසායකයා

***"කැලේ සිංහයෝ ගොඩක් නෑ. ඒත්, කැලේ රජකරන්නේ සිංහයෝ. ඒ වගේම තමයි රටක ව්‍යවසායකයෝ ගොඩක් නෑ. ඒ වුණාට ආර්ථිකයේ රජ කරන්නේ ව්‍යවසායකයෝ"***




ජෙෆ් බෙසෝස්




බිල් ගේට්ස්




මාර්ක් සකර්බර්ග්



ස්ටීව් ජොබ්ස්




දුලිත් හේරත්




ඒ. ටී. ආරියරත්න




එලොන් මස්ක්




කර්නල් සැන්ඩර්ස්




ජිෆ්රි සුල්ෆර්



වික්ටර් හෙට්ටිගොඩ

**ව්‍යවසායකයා**

**පරිසර අවස්ථා නිර්මාණශීලීව උකහා ගෙන අවදානමක් දරමින් නවෝත්පාදන බිහි කිරීමේ නිරත වන්නා ව්‍යවසායකයෙකු ලෙස හැඳින්වේ.**

ව්‍යවසායකයා යන්න හැඳින්වීමට නිශ්චිතව පිළිගත් නිර්වචනයක් නොමැත.

**ව්‍යවසායකයා සම්බන්ධ නිර්වචන**

"වෙළඳපොළෙහි ඇති වන වෙනස්කම් ව්‍යාපාර සඳහා ඇති අවස්ථාවක් ලෙස සලකන පුද්ගලයා ව්‍යවසායකයා ය. ඔහුගේ ආයුධය වන්නේ නව්‍යතා සම්පාදනයයි."

- පීටර් එෆ්. ඩකර් -

**අභ්‍යාස**

01."ව්‍යවසායකයා" යන්නට පූර්ණ අර්ථය ගෙන දෙන ප්‍රකාශය වන්නේ,

i. ලාභ ලැබීමේ අරමුණින් ව්‍යාපාරයක ආයෝජනය කරන්නා ව්‍යවසායකයා ය.
ii. ව්‍යාපාරයක කළමනාකරණ කටයුතුවල නිරතවන්නා ව්‍යවසායකයා ය.
iii. ව්‍යාපාරයක ආයෝජනය කර කළමනාකරණ කටයුතුවල යෙදෙන්නා ව්‍යවසායකයා ය.
iv. ව්‍යාපාර අවදානමට මුහුණ දෙමින් ලාභ ලබන්නා ව්‍යවසායකයා ය.
v. නව්‍යතා තුළින් වෙනස්කම් ඇති කරන්නා ව්‍යවසායකයා ය.

02.අගයක් ලබා දෙන කිසියම් දෙයක් කිරීම සඳහා අවදානම් දැරීමට කැමති පුද්ගලයකුට ............................ කියනු ලබන අතර, දැනට කරගෙන යනු ලබන ව්‍යාපාරයක සේවය කරමින් නව සොයාගැනීම් හඳුන්වා දෙමින් වෙනස්කම් ඇති කරන තැනැත්තාට ………................................ කියනු ලැබේ.

**ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර වෙනස**

**ක්‍රියාකාරකම**

**පළමුවන ප්‍රකාශය : රූපිකා තම මව පවත්වා ගෙන ගිය රූපලාවන්‍යාගාරය නවීන පහසුකම්වලින් යුක්ත නව ගොඩනැගිල්ලක පවත්වා ගෙන යයි.**

**දෙවන ප්‍රකාශය : සංජය වකුගඩු රෝගයට ඉවහල් වන ජලයේ පවතින අහිතකර ද්‍රව්‍ය ඉවත් කළ හැකි ආකාරයේ විශේෂිත ජල පිරිසිදු කිරීමේ උපකරණයක් නිපදවා සාධාරණ මිලකට වෙළෙඳපොළට ඉදිරිපත් කරයි.**

**i. මෙම පුද්ගලයින් දෙදෙනාගෙන් ව්‍යවසායකයෙකු ලෙස නම් කළ හැක්කේ කවරෙක්ද?**

**ii. එම පුද්ගලයා ව්‍යවසායකයෙකු ලෙස නම් කිරීමට හේතු මොනවාද?**

**iii. අනෙක් පුද්ගලයා හැඳින්විය හැක්කේ කවරෙකු ලෙස ද? ඊට හේතු දක්වන්න.**




| ව්‍යවසායකයා | ව්‍යාපාරිකයා |
|---|---|
| • තමාගේ ම අදහසක් හෝ නව සංකල්පයක් අනුව ව්‍යාපාරයක් අරඹයි. | • පවතින අදහසක් හෝ සංකල්පයක් අනුව ව්‍යාපාරයක් අරඹයි. |
| • ව්‍යවසායකයාගේ ව්‍යාපාරික ප්‍රතිවාදියා වන්නේ තමා ම ය. | • තවත් ව්‍යාපාරික ප්‍රතිවාදීන් ඇත. |
| • ව්‍යවසායකයා නව ව්‍යාපාර අවස්ථා කෙරෙහි සූදානම් වෙයි. | • ව්‍යාපාරිකයා නිතර ම තමන්ගේ ව්‍යාපාර කටයුතුවල නිරත වෙයි. |
| • නවෝත්පාදකයෙකි. | • සාම්ප්‍රදායිකයෙකි. |
| • අවදානමට මුහුණ දේ. | • ආරක්ෂාකාරී ව කටයුතු කරයි. |
| • ගැටලු ඇති වූ විට ඒවා පිටු දැකීමට ධෛර්යමත් ව කටයුතු කරයි. | • ගැටලු ඇති වූ විට අධෛර්යට පත් වේ. |

**අභ්‍යාස**

01.“රටක සංවර්ධනයට වඩාත් අවශ්‍ය වන්නේ ව්‍යාපාරිකයින්ට වඩා ව්‍යවසායකයින්ය.” මෙම ප්‍රකාශය, ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා සංසන්දනය කරමින් පැහැදිලි කරන්න.
(ලකුණු 04 යි)

(A/L 2017)

## ව්‍යවසායකත්ව ගති ලක්ෂණ

**සිද්ධි අධ්‍යයනය**

***කිරිගොවියා මහා ව්‍යවසායකයෙකු වූ හැටි.***

*මා ඉපදුනු හපුතලේ දී බෙරගල පාරේ අහම්බෙන් තේ බොන්නට නැවතුනු මට කිරි ගොවියෙකු මුණගැසුණි.*

*ජගත් කිරි ගොවියකු වන්නට සිහින මැව්වෙකි. පොලොන්නරුව ප්‍රදේශයේ ඉපිද ගුරුතලාවේදී අකුරු කෙරු දිනවල එය හිතට එන්නෙට ඇත. පොළොන්නරුවේ තිබු ව්‍යාපාර සහෝදරයාට භාර දුන් ඔහු හපුතලේ බොරලන්දේ දී තම කිරි ගොවිපොළ ආරම්භ කළේ ඒ ගැන කිසිවක් නොදැනය. වසර එකහමාරක් පමණ යනවිට තම කිරි ගව පට්ටිය 80ක් දක්වා වැඩිකරගත් අතර කිරිගවයන් 80කට කෑම සැපයීම, කිරි ගැනීම ආදී දහසක් කටයුතු සටනක් සේ සීතල බොරලන්දේ දී තම දෑතින් කළේය.*

*ලීටරය රුපියල් 60/= කට කිරි එකතු කරන්නන් හට විකුණු ඔහුගේ ව්‍යාපාරය දිනකට රුපියල් 10,000/= පාඩු පිට දුවන්නට විය. ලාභ හෝ පාඩු නොවන්නටනම් කිරි ලීටරය රුපියල් 100/= කට වත් අලෙවි කල යුතු විය. එහෙත් එවැනි මිලකට කිරි ගන්නට කිසිවෙක් සීතල බොරලන්දේ නොවීය. කිරි ගොවිපළ වසා දැමීමට සිතුනද හරකුන් මසට විකිණීම කිසිසේත්ම ඔහුගේ න්‍යාය පත්‍රයේ නොතිබුණේය. යෝගට් කර්මාන්තය වැනි වෙනත් කිරි ආශ්‍රිත නිෂ්පාදන ගැන සොයා බැලුවිට යන්ත්‍ර සූත්‍ර, දැනුම සහ ප්‍රාග්ධනය හෝ තමා සතු නොවන බව දැනටමත් අමාරුවේ වැටී ඇති ඔහුට පැහැදිලිය.*

*නිෂ්පාදනයන්ගෙන් ඉහළ මිලක් ගැනීමට නම් අගය එකතු කල යුතු බව ඔහුට දැනුණි. එහෙත් අගය එකතු කිරීමේ සම්ප්‍රදායික ක්‍රම වේදයන් සියල්ල ඔහුට දියුණුවක් ගෙන දීමට සමත් නොවන බවත් ලාභය වැඩිකිරීමට නම් එවන් අගය එකතු කිරීමක් ප්‍රමාණවත් නොවන බවත් ඔහුට වැටහුණි.*

*බොරලන්දේ සිට කිලෝමීටර 15ක් දුරින් තිබුණු බදුල්ල කොළඹ ප්‍රධාන පාර ගැන ඔහුට මතක් විය. කොළඹ සිට උඩරට දක්වා දිනපතා ගමන් ගන්නා මිනිසුන් ප්‍රමාණය ඔහුට නෙත ගැටුණි. වසා තිබුණු අඩි 6 x 6 පමණ කුඩා කඩ කැබැල්ලක් දින ගණනාවක මහන්සියෙන් අයිතිකරු සොයා ගොස් මාස්පතා කුලී පදනම මත ලබා ගත්තේය. කුමක් සිදුවේදැයි නොදන්නා නමුත් තම කිරි කෙලින්ම පාරිභෝගිකයාට බීමට ලබා දෙන්නට ඔහුට අවශ්‍යවිය. වෙනත් ගැලවීමේ මගක් ඔහු ඉදිරියේ නැත. ආම්පන්න ලෙස නිවසේ තිබුණු පිරිසි කෝප්ප හයක් ඔහුට සහය විය. කිරි ගොවියා කිරි වෙළෙන්දා වූයේ එලෙසිනි.*

*අඩි 6 x 6 කඩ කැබැල්ල වේගයෙන් දියුණු වෙන්නට විය. බොරලන්දේ නැවුම් කිරි කොළඹ සිට යන එන වාහනවල සිටි අයගේ විඩාව නිවන්නට විය. කඩ කැබැල්ලට බෝඩ් ලෑලි කිහිපයක් එකතු කරන ලද අතර ස්ට්‍රෝබෙරි වැනි වෙනත් නිෂ්පාදනද අලෙවියට තබන ලදී. කුඩා කාලයකදීම ඔහුට කිරි ඉතිරෙන්නට අලෙවිය වැඩිවුණි. නුදුරේ පිහිටි තේ සෙන්ටර් ආයතනයෙහි කළමනාකරු ඔහුට කතාකොට එම ස්ථානයෙහි තම කිරි අලෙවිය කරන ලෙසට ආරාධනා කලේ ජගත්ගේ කිරි අලෙවිය ඔවුන්ගේ අලෙවියට බලපෑමක් කළ නිසා විය හැකිය. නව ස්ථානය Golden Hill Tea Center නමින් නම් කෙරිණි. බොරලන්දේ කිරි ගොවින් දැන් තම කිරි නිෂ්පාදන ජගත්ට ලබා දෙයි.*

වසා දමා තිබුණු තේ කම්හලක් කුලී පදනම මත ඔහුට හිමිවූයේ නොපසුබට උත්සාහය නිසාය. දිනකට කිලෝමීටර් සියයක් පමණ ඔහු එහෙ මෙහෙ දුවමින් කල සටනේ ප්‍රතිපල ලැබෙමින් පැවතුනේය. දිනපතා තම අලෙවිය ගණන් තැබීම නිසා අලෙවිය වැඩි හා අඩු කාලයන් ගැන අවබෝධයක් ලැබෙන්නට විය. නව කිරිහලට ඔහුගේම ස්ට්‍රෝබෙරි විකිණීමට තැබීමට හැකිවිය. කාබනික එළවළු වගාවටත් අත දැමූ ඔහුගේ ගුරුවරයා යු ටියුබ් විය. කිසිදිනක ස්ට්‍රෝබෙරි වග කර නැති ඔහු එය උගත්තේ යු ටියුබ් තුලිනි.






ඔහුගේම වචනවලින් කිවහොත් දියුණුව සඳහා අවශ්‍ය වන වැදගත්ම කාරණයකි 200% ක කැපවීම. ඔහුට එය යහමින් තිබුණි. බොහෝ ව්‍යවසායකයින් අතර කැපවීම හිඟය. එනිසාම දියුණුව දුරය. ඔහුගේ අලුත් දේ ඉගෙනීමට ඔහුට ඇති ආශාව මම දුටුවෙමි. එයද ඔහුගේ දියුණුවට හේතුවී ඇත. සේවකයින්ට ඉතාම හොඳින් සැලකීම ආයතනය දියුණුවට බලපාන්නේ ඔවුන් විසින් පාරිභෝගිකයින් රකින නිසාය. ජගත් එය හොඳින් දනියි. අගය එකතු කර විකිණීම කලාවක්නම් ජගත් එහි පිකාසෝ යැයි මට සිතෙයි.

මේ අතරේදී ඔහු සංචාරක හෝටල් ව්‍යාපාරයට ද අත ගැසූ අතර, ඔහු කළමනාකරණය කරන හපුතලේ පිහිටි හෝටල් ගණන පහකි. නගරයේ කෙළවරක ඇති Olive View Point ආපනශාලාව ඔහුගේ තවත් ආයතනයකි. නැවුම් කිරි විදුරුවක් බොන්නට, දිවා ආහාරය ගන්නට Golden Hill Tea Center වෙත යන ඔබ නැවුම් කිරි කෝප්පයක් පානය කල පසු ඔහුගේම නිෂ්පාදනයක් වන ස්ට්‍රෝබෙරි අයිස්ක්‍රීම් එකක් කන්නට අමතක කරන්න එපා.

හොඳ ව්‍යවසායකයෙක් වන ආකාරය ජගත්ගේ කතාවෙන් ඉගෙන ගන්නට හැකිය.

01.ජගත්ගේ චරිතයේ දැකිය හැකි සුවිශේෂී ව්‍යාසායකත්ව ගති ලක්ෂණ මොනවාද?


02.ජගත් විසින් හඳුනාගන්නා ලද ඉහත සිද්ධියෙහි සඳහන් ව්‍යාපාර අවස්ථා මොනවාද?

## ව්‍යවසායකත්ව ගති ලක්ෂණ

- අවදානම් දැරීමට ඇති කැමැත්ත (willingness to take risks)
  අවදානම් මගහැරිමට වඩා අවදානම්වලට මුහුණ දීමට කැමැත්තක් දක්වයි. නමුත් ඕනෑම අවදානමකට මුහුණදීමක් මින් අදහස් නොකෙරේ.
- ස්වාධීනබව (Self-reliant)
  වෙනත් අයගේ අදහස් මත යැපෙනකු නොවී තමන්ගේ අදහස් හා හැකියා හැකිතරම් දුරට ක්‍රියාත්මක කිරීමට ඇති කැමැත්තයි.
- කැපවීම (Commitment)
  තම අරමුණු ඉටු වන තෙක් තමන් කරන කාර්යය දැඩි උනන්දුවකින් යුතුව සිදු කිරීම.
- ආත්ම විශ්වාසය (Self Confidence)
  ව්‍යවසායකයෙකුට විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු වන අතර, ඒවාට සාර්ථකව මුහුණ දී එම ගැටලු පිටු දැකීමට හැකි ය යන විශ්වාසයයි
- නිර්මාණශීලිබව (Creativity)
  වෙනස් ආකාරයකට දැකීම, සිතීම හා ක්‍රියාකිරීම



වෙනස් විදිහට බලන්න.



**අභ්‍යාස**

01. පුද්ගලයකු සතු ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
    A - ගැටලු නිසා අධෛර්යමත් වීම
    B - සාම්ප්‍රදායික ක්‍රම ක්‍රියාත්මක කිරීමට ඇති කැමැත්ත
    C - අවදානම් භාරගැනීමට ඇති කැමැත්ත
    D - වෙනස් නොවන පරිසරයක වැඩ කිරීමට ඇති කැමැත්තක
    E - අභියෝග භාරගැනීමට ඇති කැමැත්ත

    ඉහත දෑ අතුරෙන් ව්‍යවසායකයකු සතු ලක්ෂණ පමණක් ඇතුළත් වරණය කුමක් ද?
    (1) A සහ E
    (2) B සහ C
    (3) C සහ D
    (4) C සහ E
    (5) D සහ E

(A/L 2019 New)

02. ව්‍යවසායකයකුගේ ගති ලක්ෂණයක් නො වන්නේ,

i. ආත්ම විශ්වාසය
ii. ස්වාධීන බව
iii. සුභවාදී බව
iv. ඕනෑම අවදානමක් දැරීම
v. නම්‍යශීලී බව

(A/L 2002)

03.

i. .........................................
ii. .........................................
iii. .........................................
iv. .........................................

ව්‍යවසායකත්ව නිපුණතා (Competencies) කිහිපයක් ලෙස දැක්විය හැක.

(A/L 2014)

04. තමන්ගේ අභිමතය පරිදි වැඩ කිරීමට හා තීරණ ගැනීමේ නිදහස ව්‍යවසායකයා අපේක්ෂා කරයි. මෙම ගති ලකෂණය කුමක්ද?

05. අමල් කුඩා කල සිට ම ව්‍යවසායකයකු වීමේ අදහසින් සිටි අයෙකි. නමුත් මූල්‍යමය වශයෙන් ශක්තිමත් නොවූ නිසා ඔහු සුළු ප්‍රාග්ධනයකින් ආරම්භ කළ හැකි, අර්ධ අගනා මැණික් ගල් භාවිත කර විසිතුරු භාණ්ඩ නිපදවීමේ ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. එය මේ වන විට දියුණු තත්වයකට පත් වෙමින් තිබේ. මෙම සිද්ධියට අනුව ව්‍යවසායක ගති ලක්ෂණ දෙකක් හේතු සහිතව විස්තර කරන්න. (ලකුණු 04 යි)

(A/L 2017)

## ව්‍යවසායකත්ව කුසලතා

- නායකත්ව කුසලතා (Leadership Skills)
  තමාගේ ව්‍යාපාරයේ නායකයා තමා ය. තම අනුගාමිකයින් ලවා කාර්යය ඉටු කරවා ගැනීම සඳහා ඔවුන් ධෛර්යමත් කරමින් විධිමත්ව මෙහෙයවයි.

- අන්තර්පුද්ගල කුසලතා (Interpersonal Skills)
  බාහිර හා අභ්‍යන්තර පාර්ශ්ව සමග මනා සම්බන්ධතාවක් පවත්වා ගෙන යයි.

- සන්නිවේදන කුසලතා (Communication Skills)
  තොරතුරු ඔහුට සම්පතකි. අරමුණු ඉටු කර ගැනීමට මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යයි.

- මූලික කළමනාකරණ කුසලතා (Basic Management Skills)
  සැලසුම්කරණය, සංවිධානකරණය, මෙහෙයවීමේ හා පාලනය යන මූලික කළමනාකරණ කුසලතාවලින් යුක්ත වීම

**ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා වර්ධනය කර ගත හැකි ආකාර**

- ස්වයං ඇගැයීම
  පළමුව ව්‍යවසායකත්ව නිපුණතා නිශ්චිතව හඳුනා ගෙන, එම නිපුණතා තමා තුළ කොතෙක් දුරට පවතී ද? තමා තුළ නැති නිපුණතා මොනවා ද? තවදුරටත් සංවර්ධනය කර ගත යුතු නිපුණතා මොනවා ද? යන්න ස්වයං ඇගැයීමක් කිරීම

- පුහුණුව
  ව්‍යවසායකත්ව නිපුණතා සංවර්ධනය කර ගැනීමට ඇති විවිධ පුහුණු වැඩසටහන්වලට සහභාගී වීම

- අධ්‍යාපනය
  සාමාන්‍ය අධ්‍යාපනයට අමතර ව, ව්‍යවසායකත්වය පිළිබඳ ව ලබන අධ්‍යාපනය

- අත්දැකීම්වලින් ඵල ලැබීම
  වෙනත් ව්‍යවසායවල කටයුතු කිරීමෙන් හෝ තමා ම ව්‍යවසායකයෙකු ලෙස කටයුතු කිරීමෙන් ලබන අත්දැකීම්

**ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම ව්‍යවසායකයා සම්මානය** (Sri Lankan Entrepreneur of the Year)

- ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම ව්‍යවසායකයා සම්මානය Sri Lankan Entrepreneur of the Year ජාතික තලයේ ව්‍යවසායකත්වය ඇගයීමට ලක් කරන ප්‍රධානතම සම්මාන උළෙලයි.
- ශ්‍රී ලාංකේය ව්‍යවසායකත්වය හඳුනා ගැනීම, එම කුසලතාවය අගය කිරීම මෙන්ම, දිරිගැන්වීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා වානිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය The Federation of Chambers Commerce and Industry of Sir Lanka (FCCISL) විසින් සම්මාන උළෙල වාර්ෂිකව සංවිධානය කෙරේ.

**ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්වය සංවර්ධනය සඳහා දායක වන ආයතන සඳහා නිදසුන්**

- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය
  (ශ්‍රී ලංකාවේ ව්‍යවසාය සංවර්ධනය සඳහා 2006 අංක 17 දරණ ජාතික ව්‍යවසාය සංවර්ධන පනත යටතේ සංස්ථාපනය කළ ආයතනය යි.)
- ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
- ජාතික මෝස්තර මධ්‍යස්ථානය
- ජාතික ශිල්ප සභාව
- ප්‍රාදේශිය සංවර්ධන බැංකුව
- ශ්‍රී ලංකා නව නිපැයුම් කරුවන්ගේ කොමිෂම
- ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාලය

**ඇගයීම**

01.ව්‍යවසායකයකු සාමාන්‍යයෙන් …………………….. අරමුණු කරගෙන ව්‍යාපාර ආරම්භ කරන අතර, සමාජීය ව්‍යවසායකයකු............. අරමුණු කරගෙන ව්‍යාපාර ආරම්භ කරයි.
(A/L 2019 New)

02.පහත දෑ අතුරෙන් වඩාත් ම නිවැරදි ප්‍රකාශය තෝරන්න.
i. ව්‍යවසායකයා ව්‍යාපාරිකයෙකි.
ii. ව්‍යවසායකයා කළමනාකරුවෙකි.
iii. ව්‍යවසායකයා වෘත්තිකයෙකි.
iv. ව්‍යවසායකයා විශ්ලේෂකයෙකි.
v. ව්‍යවසායකයා අවස්ථා සොයන්නෙකි

03.ව්‍යවසායකත්ව කුසලතාවකි. (Entrepreneurial Skill)
i. කඩිසර බව (Diligent)
ii. ආචාරසම්පන්න බව (Polite)
iii. ශක්තිමත් බව (Energetic)
iv. සන්නිවේදන (Communicative) |
v. අවංකවීම (Honest)

04.

A - තමන්ගේ හැකියාවන් උපරිම අන්දමට භාවිත කිරීමට ඇති කැමැත්ත

B - සමාජයේ පවත්නා කිසියම් සමාජ ප්‍රශ්නයක් විසඳීම සඳහා දායක වීමට ඇති කැමැත්ත

C - රැකියාවන්ගෙන් ලද අත්දැකීම්

D - ස්ථාවර ආදායමක් ලබා ගැනීමට ඇති කැමැත්ත

E - යම් ක්ෂේත්‍රයක් පිළිබඳ ලබා ඇති අධ්‍යාපනය හා පුහුණුව

F - අවදානම් අවම කර ගැනීමට ඇති කැමැත්ත

ඉහත දෑ අතුරෙන් ව්‍යවසායකයකු බිහිවීමට හේතු විය හැකි කරුණු ඇතුළත් සංයෝගය තෝරන්න.

i. A,B,C,D
ii. B,C,E,F
iii. A,B,C,E
iv. C,D,E,F
v. A,B,D,E (A/L 2014)

05.කළමනාකරු හා සසඳන කළ ව්‍යවසායකයකුගේ සුවිශේෂ භූමිකාවක් වනුයේ,
i. නායකත්වයයි.
ii. නව්‍යතා සම්පාදනයයි.
iii. තීරණ ගැනීමයි.
iv. සංවිධානය කිරීමයි.
v. සැලසුම් කිරීමයි.

06.ව්‍යවසායකයකුගේ මූලික කාර්යය වන්නේ,
   i. වෙහෙස වී වැඩ කිරීම ය.
   ii. ලාභ උපරිම කිරීමයි.
   iii. නව්‍යතා සම්පාදනයයි.
   iv. කැපවීමයි.
   v. ඉලක්ක සපුරා ගැනීමයි.

07. අවදානමක් දරමින් ……………………….. ඇති කරන පුද්ගලයා ව්‍යවසායකයකු වන අතර ඔහු සෑම විටම ……………………….. නොවේ. (A/L 2018)

08. ව්‍යවසායකත්වය සංවර්ධනය සඳහා රජයට ගත හැකි පියවර 05 නම් කරන්න.

09.ව්‍යවසායකයින් විශාල වශයෙන් රටකට අවශ්‍ය වුවත් ඔවුන් බිහිවන්නේ සුළු වශයෙනි. එසේ සුළු වශයෙන් ව්‍යවසායකයින් බිහිවීමට බලපාන්නු ලබන සාධක හතරක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි) (A/L 2018)

10."ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සංවර්ධනයට ප්‍රධානතම බාධකය වී ඇත්තේ ව්‍යවසායකයින්ගේ හිඟකමයි." සාකච්ඡා කරන්න. (A/L 2017 Old)

11.කාන්තා ව්‍යාවසායකත්ව සංවර්ධනය කෙරෙහි බලපාන අභියෝග හතරක් සඳහන් කරන්න.

12.ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා වර්ධනය කර ගත හැකි ආකාර හතරක් විස්තර කරන්න.

**ඉගෙනුම් ආධාරක**

- ලොව ජය ගත් ව්‍යවසායකයන් පිළිබඳ තොරතුරු
    - කර්නල් සැන්ඩර්ස් - https://youtu.be/t51ig7Z8QmI
    - එලොන් මස්ක් - https://youtu.be/YPQzgY-Ps4c
    - වික්ටර් හෙට්ටිගොඩ - https://youtu.be/MqXHBNKRqdc

- ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම - https://youtu.be/DubdqpkKsPA

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

“The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements.”